**ශීර්ෂය 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස **අමාත්‍යාංශයේ** අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මුළු වියදම රු.4,986,375,473 ක් වුවද මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ මුළු වියදම රු.4,982,792,266 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් විදේශ ණය රු.3,583,207 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව අමාත්‍යාංශයේ වියදම් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයේ සඳහා වියදම් ශේෂ සමඟ එකඟ කර දැක්වීමට කටයුතු කළ යුතු වීම. | 2019.01.30 දින භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශයට අනුව මුළු වියදම රු.4,982,792,266 ක් වූව ද අවසන් වරට එනම් 2019 පෙබරවාරි 05 දින භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශයට අනුව සත්‍ය වියදම වූයේ රු.4,986,375,473කි. එම නිසා භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශයට අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය නිවැරදිය. |

### 1.6.2 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන173.81 ක් වූ ශේෂය සම්බන්ධයෙන් කේවල ශේෂ ලැයිස්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර ශේෂ එකතුව රු.මිලියන 78.6 ක් විය. මුදල් රෙගුලාසි 571 ප්‍රකාර වර්ෂ 02 කට වැඩි තැන්පතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් හඳුනාගෙන, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි . | පොදු තැන්පතු ලේඛනයේ වර්ෂයේ ලැබීම්, ගෙවීම් හා ශේෂයන් පැහැදිලිව සටහන් කළ යුතු අතර වර්ෂය අවසාන තැන්පතු ශේෂය සම්බන්ධයෙන් කේවල ශේෂ ලැයිස්තු ඉදිරිපත් කළ යුතුවීම හා තැන්පත් නිරවුල් කිරීම සම්බන්ධව රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘතින්වල රඳවාගැනීම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය බිල්පත් ඉදිරිපත් නොවීම හා කොන්ත්‍රාත් වගකීම් කාලය අවසන් නොවීම මත අවුරුදු 2 – 5 අතර ශේෂ එකතුව රු.මිලියන 78.6 ක මුදල නිදහස් කිරීමට නොහැකි වී ඇත. එමෙන්ම අමාත්‍යාංශයට අදාළ කේවල ශේෂ අමාත්‍යාංශ තැන්පත් ලේඛනයේ සඳහන්ව තිබු අතර උප කාර්යාලවලට අදාළ කේවල ශේෂයන් අමාත්‍යාංශ පොදු තැන්පත් ගොනුවේ ඇතුළත් කර තිබුණි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ නොපියවූ අතුරු අග්‍රිම ශේෂය රු.45,246,534 ක් වූ | අග්‍රිම ශේෂ අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවීම. | ආයතනයේ දැනට තිබෙන අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් එම අත්තිකාරම් |

| | | |
|---|---|---|
| අතර, ධීවර සංස්ථාවට 2010 හා 2014 වර්ෂවලදී ලබාදී තිබුණු පිළිවෙලින් රු.8,000,000 ක හා රු.1,679,428 ක් එහි ඇතුලත්ව තිබුණි. | | මුදල් පියවීමට අපොහොසත් වී ඇති බවත්,ඉදිරි වර්ෂවල ලාභ ඉපයීම මත මෙම අත්තිකාරම් මුදල් හැකි ඉක්මනින් පියවීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ප්‍රවාහන අංශයේ හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. තවද වෙනත් හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | විගණනයේ දක්වා ඇති කරුණු සමඟ එකඟ වෙමි. මින් ඉදිරියට අමාත්‍යාංශය සතුව හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| (ආ) | විදුලි උපකරණ සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතු වීම. | පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | අමාත්‍යාංශය පවත්වාගෙන යන පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | යාවත්කාලින කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i. XXIV පරිච්ඡේදයේ 1.6 ඡේදය | නිලධාරීයෙකු මාරු වී පැමිණ මාස 02 ක් ගතවීමෙන් පසු හෝ නිලධාරීයෙකු මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු ණය ශේෂ නිරවුල් කරගත යුතු වුවත් 1987 වර්ෂයේ සිට 1994 වර්ෂයේ කාල පරාසය තුළ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.295,772 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම ණය ශේෂයන් පිළිබඳ කිසිදු විස්තරයක් සොයා ගත නොහැකි බැවින් 1999 ඔක්තෝබර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 369 අනුව අදාළ ණය ශේෂයන් කපා හැරීමට කටයුතු කර ඇත. |
| ii. XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 ඡේද | විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරියෙකුගෙන් අයවිය යුතුව ඇති සියලුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ඉදිරිපත්කර නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදලින් ණය මුදල් සියල්ලම අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 1985 සිට 1991 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිලධාරීන් 34 දෙනෙකුගෙන් රු.127,580 ක ණය ශේෂ අයනොවී පැවතුණි. | XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 ඡේදවල සඳහන් විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ පිළිබඳ විස්තර සොයා ගැනීම ඉතා අපහසු වේ. ණය ශේෂ කීපයක් අයකරගෙන ඇති අතර ඉතිරි ණය ශේෂ 1999 ඔක්තෝබර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 369 අනුව කපා හැරීමට කටයුතු කර ඇත. |

1.6.5 **අවිධිමත් ගනුදෙනු**

**----------------------**

**(අ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | -------------------------- |
| i. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් ධීවර ප්‍රජාව බල ගැන්වීමේ ව්‍යාපෘතියට වෙන් කළ මුදලින් රු.මිලියන 4 ක් ධීවර සංස්ථාවට ලබාදී තිබුණි. විශේෂ නීතියකින් සැපයෙන අධිකාර බලයක් නොමැතිව එම මුදලින් සංස්ථාව ත්‍රිකුණාමලයේ මත්ස්‍ය වෙළඳ සංකීර්ණයෙහි තීන්ත ආලේප කිරීමේ වියදම් රු.මිලියන 3.7 ක් හා විදුලි පද්ධතිය අළුත්වැඩියා වියදම් රු.235,221 ක් වශයෙන් 2017 වර්ෂයේ වියදම් පියවා ගැනීමට යොදවා තිබුණි. | මුදල් රෙගුලාසි 200(2) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු මඟින් හා විශේෂ නීතියකින් සැපයෙන අධිකරණ බලයක් මත වියදම් දැරිය යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |
| ii. | තෙත් කලාපයේ මිරිදිය වැව් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන ලබා නොදෙන බවත් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී ලබාගත හැකි ප්‍රතිපාදන උපයෝගී කරගත යුතු බව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් දන්වා තිබුණි. එසේ තිබිය දී කලපු 10 ක් පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මිලියන 1000 ක මුදලින් ගම්පහ, කෑගල්ල, කළුතර, මාතර ප්‍රදේශවල වැව් 99 ක් සංවර්ධනය කිරීමට රු.මිලියන 20 ක් කෘෂි සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ අනුමැතිය ලබානොදුන් ක්‍රියාකාරකම්වලට මුදල් නොයෙදවීම කළ යුතු වීම | පිළිතුරු ලබා දී නැත. |

**(ආ) අනුමත නොකළ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව කාර්යාල සේවක සේවයේ තනතුර දරන්නකුගේ ඉල්ලීම මත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු කර තිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ස්ථාන මාරු නියෝග මත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියක් ලබාගෙන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වීම. | විගණනයේ දක්වා ඇති කරුණු පිළිගනිමි. මෙ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුවේ සඳහන් කර නොතිබුණු වැය විෂයයන් 8 ක් අලුතින් ඇතිකර ඒ සඳහා රු.මිලියන 1,714.45 ක් පරිපූරක ප්‍රතිපාදන මඟින් මුදල් වෙන්කරවා ගෙන තිබුණ ද ඉන් රු.මිලියන 183 ක් වූ වැය විෂයයන් 3 කට අදාල මුළු පරිපූරක ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. වැය විෂයයන් 4 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන්කළ රු.1,159,092,254 කින් සියයට 71 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ජාතික අයවැයට ඇති වන අහිතකර බලපෑම අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉතිරිවීම් ඇතිවීමට හේතු වශයෙන් භාණ්ඩාගාර අක් මුදල් නොලැබීම ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම වැනි කරුණු ඉදිරිපත් කර ඇත. අලුතින් ඇති කළ වැය විෂයයන් සඳහා පරිපූරක ප්‍රතිපාදන වෙන්කිරීම්වල ඉතිරිවීම් පිළිබඳ හේතු ඉදිරිපත් කර ඇත. |
| (ආ) | අමාත්‍යාංශ විසින් 2017 වර්ෂයේ දී විසිතුරු මත්ස්‍ය අභිජනනය සඳහා නාරා ආයතනයට ලබාදුන් රු.2,066,250 ක අත්තිකාරම් මුදල ඉක්මවා වැයකළ රු.1,488,816 ක් පියවීම සඳහා 2018 වර්ෂයේ දී නව තාක්ෂණය හඳුන්වාදීම යටතේ ලබාදුන් | ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ දී සැලසුම් කළ ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන උපයෝගී කරගෙන තිබුණි. | | |
| (ඈ) | 2018 වර්ෂයේ විසිතුරු ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශ විසින් නාරා ආයතනයට ලබාදුන් රු.මිලියන 4.09 ක අත්තිකාරම් මුදලින් ඉකුත් වර්ෂයට හා ඉදිරි වර්ෂයට අදාලව වැය කළ එකතුව රු.930,142ක් රෙගුලාසිවලින් බැහැරව 2017 හා 2019 වර්ෂයේ වියදම් පියවීම සඳහා ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371(6) හි සඳහන් විධිවිධානවලට පටහැනිව අත්තිකාරම් නිරවුල් කිරීමේ දී අත්තිකාරම් ලබාගැනීමට පෙර කරන ලද වියදම් හිලව් කිරීම හා ඉතිරි වර්ෂයේ වියදම් හිලව් කිරීම නොකළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ඇ) | ධීවර කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති 22 ක් සඳහා 2018 ඇස්තමේන්තුවෙන් ලබාදුන් රු.මිලියන 4,920.5 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 2578.7 ක් හෙවත් සියයට 52 ක් ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය<br>-------------------- | නිර්දේශය<br>---------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන ඉතිරි වී නොතිබීය දී හා ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා වැය විෂයයන් 10 ක් සඳහා රු.මිලියන 646.20 ක් බැරකම්වලට බැඳී තිබුණි. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වැය විෂයයන්ගෙන් ඉතිරිවීම් ඉක්ම වූ බැරකම් හා වියදම් ප්‍රමාණය මුදල් වර්ෂයේ ප්‍රතිපාදන නොඉක්මවිය යුතුවීම හා ඒ ඒ වැය විෂයයන් සඳහා වෙන්කළ මුදල ඇතුළත වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. | එසේ ප්‍රතිපාදන නොමැති වුවද වැය විෂයයන් 10 ක් පවත්වාගෙන යනු ලබන්නේ අමාත්‍යාංශ එදිනෙදා පවත්වාගෙන යාමේ දී දැරීමට සිදුවන අත්‍යාවශ වියදම් වෙනුවෙනි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ධීවර අංශයේ සංවර්ධනයට සහායදීම හම්බන්තොට ව්‍යාපෘතිය යටතේ බයිසිකල් 7,000 ක්, ජීවිත ආරක්ෂක කබා 1,000 ක්, මහන මැෂින් 1,000 ක් හා කෘෂි උපකරණ 60,000 ක් වශයෙන් ධීවර ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීම මුල් කරගෙන රු.මිලියන 300 ක විදේශ මුදල් ප්‍රදාන හා රු.මිලියන 43.4 ක් දේශීය අරමුදල් වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදනය කර 2018 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් විදේශ මුදල් රු.මිලියන 81.40 ක් දේශීය අරමුදල් රු.මිලියන 43.32 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| i. | ව්‍යාපෘතියේ කාර්යයන් හඳුනාගෙන 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කාර්යයන් හඳුනාගෙන 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර මෙවැන්නක් නොවීමට වග බලා ගන්නා බව දන්වන අතර පසුවිපරම් ක්‍රියාවලියේ දුර්වලතා පැවති බව පිළිගනිමි. |
| ii. | ධීවරයින් වෙත ලබාදෙන ලද බයිසිකල්, ජීවිත ආරක්ෂක කබා, මහන මැෂින් හා කෘෂි උපකරණ භාරදුන් බව සනාථ කරගැනීම සඳහා අමාත්‍යාංශය විසින් පසුවිපරම් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය මූලික ලේඛන හා පොත්පත් පවත්වා ගැනීම මඟින් කටයුතු සනාථ කරගැනීමට හැකියාව තිබිය යුතු වීම | අමාත්‍යාංශයේ වගකීමක් බව පිළිගන්නා අතර එම වගකීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතන වන ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත පැවරූ අතර එම ක්‍රියාවලිය පිළිබඳව වූ පසුවිපරම් කටයුතු ප්‍රමාණවත් නොවූ බව පිළිගනිමි. |
| iii. | ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ඍජු මුදල් වියදම් කිරීම රු.මිලියන 138 ක් ලෙස | වියදම් ලේඛන මූල්‍ය ප්‍රකාශන හා සැසඳීම් කිරීමට හැකිවන පරිදි සකස් කළ යුතු වීම. | ව්‍යාපෘතිය සඳහා සමුච්චිත ඍජු මුදල් වියදම් ලෙස රු.මිලියන 138 ක් වියදම් දරා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 81.4 ක් ලෙස සඳහන් වී ඇත්තේ |

| | | | |
|---|---|---|---|
| | සඳහන් කර තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 81.40 ක් වූයෙන් රු.මිලියන 56.60 ක වෙනසක් නිරීක්ෂණය විය. | | බයිසිකල් 7000 ක්, මහන මැෂින් 1000 ක් හා උදලු තල 60000 ක් ආනයනය කිරීම සඳහා දරා ඇති සමුච්චිත අගය රු.මිලියන 138 ක් වී ඇති බව දන්වමි. |
| (ආ) | මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීම මුල් කරගෙන බෝට්ටු හා එන්ජින් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ෆයිබර් ග්ලාස් බෝට්ටු 150 ක් හා පිටත සවි කරනු ලබන එන්ජින් 150 ක් ලබාදීමට වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 117 ක් විදේශ මුදල් ප්‍රදාන හා රු.මිලියන 15 ක් දේශීය අරමුදල් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට විදේශ මුදල් ප්‍රදාන වශයෙන් රු.මිලියන 64.06 ක් ද ශ්‍රී ලංකා අරමුදල් වශයෙන් රු.මිලියන 7.06 ක් ද වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| i. | මෙම ව්‍යාපෘතියේ කාර්යයන් හඳුනාගෙන 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කාර්යයන් හඳුනාගෙන 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර මෙවැන්නක් නොවීමට වග බලා ගන්නා බව දන්වමි. |
| ii. | ධීවරයින්ට ලබාදෙන බෝට්ටු හා එන්ජින් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට ලේඛනයක් පවත්වා ගැනීමට හා බෙදාහැරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමටත් මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත පවරා තිබුණ ද එම අයිතම අදාල ප්‍රතිලාභීන් වෙත භාරදුන් බව සනාථ කරගැනීම සඳහා අමාත්‍යාංශය විසින් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අවශ්‍ය මූලික ලේඛන හා පොත්පත් පවත්වා ගැනීම මඟින් කටයුතු සනාථ කරගැනීමට හැකියාව තිබිය යුතු වීම. | පසුවිපරම් ක්‍රමවේදයේ දුර්වලතා තිබූ බව පිළිගනිමි. |
| iii. | ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ඍජු මුදල් වියදම් | වියදම් ලේඛන මූල්‍ය ප්‍රකාශන හා සැසඳීම් කිරීමට හැකිවන පරිදි සකස් කළ යුතු වීම. | ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය විසින් වියදම් ගණනය භාණ්ඩ ඇණවුම් නියෝගවල සඳහන් මුදල |

| | | | |
|---|---|---|---|
| | කිරීම රු.මිලියන 75.2 ක් ලෙස සඳහන් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 64.06 ක් වූයෙන් රු.මිලියන 11.14 ක වෙනසක් නිරීක්ෂණය විය. | | සලකා බලා ඇති බැවින් එම ගණනය කිරීම නිවැරදි නොවේ. විගණන විමසුමෙන් පෙන්වා දුන් මුදල වන රු.මිලියන 64.06 නිවැරදි බව සඳහන් කරමි. |
| (ඇ) | සාකල්‍ය (Holistic) ගම්මාන සංවර්ධනය වැඩසටහන සඳහා වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනය රු.මිලියන 300 ක් විය. වැඩසටහනේ මූලික අරමුණක් වූ ධීවර ප්‍රජාවගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේ දී පොදු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට සියයට 80 ක මූලිකත්වයක් දී තිබුණි. | අදාල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සිදුකරන ක්‍රියාකාරකම් තුලින් ව්‍යාපෘති අරමුණ ඉටුකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. | හඳුනාගන්නා ගැටලු මත පදනමව ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම ප්‍රජාවගේ ඉල්ලීම හා අවශ්‍යතාවය මත සිදු කරයි. ඒ අනුව ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සියල්ල ධීවර ප්‍රජාවගේ කැමැත්ත මත ප්‍රමුඛතා ගත වූ ව්‍යාපෘති වේ. |
| (ඈ) | නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා ව්‍යාපෘති දෙකකට වාර්ෂික ඇස්තමේන්තුව මඟින් රු.මිලියන 12.5 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එම මුදල්වලින් කළයුතු ක්‍රියාකාරකම් 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | විධිමත් ඇගයීමකට ලක්කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුවීම සහ ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ දී සැලසුම් කළ ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**---------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ----------------------------- |
| (අ) | කලපු 10 පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය<br>---------------------------------- | | |
| i. | 2018 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව මඟින් කලපු 10 ක රොන්මඩ ඉවත්කර ගැඹුරු කර පිරිසිදු කිරීම සඳහා රු.මිලියන 1000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පුත්තලම,නයාරු, ආරුගම්බේ හා රැකව කලපු සඳහා ප්‍රමුඛස්ථානය දෙමින් කටයුතු කරන | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛ ස්ථානය දෙමින් කටයුතු කළ යුතු වීම. | කලපු ආශ්‍රිතව අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය මෙම ව්‍යාපතියේ අරමුණකි. ජීවනෝපාය වැඩසටහන් මෙන්ම ක්‍රියාකාරි සැලැස්මේ දක්වා ඇති සෙසු සංවර්ධන ව්‍යාපෘති මඟින් ද කලපු සංවර්ධනය හා නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන |

| | | | |
|---|---|---|---|
| | බව දක්වා තිබුණ ද කිසිදු කලපුවක් සංවර්ධනය කර නොතිබුණි. මෙම ප්‍රතිපාදනවලින් නාරා ආයතනයට, ජාතික ජලජ සම්පත් හා ජලජීවී වගා සංවර්ධන අධිකාරියට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල යනාදියට වෙනත් උප ව්‍යාපෘති යටතේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 171.06 ක් වැයකර තිබුණි. | | සඳහා සෘජු හෝ වක්‍ර ප්‍රතිඵල ලැබේ. |
| ii. | කලපු පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ජලජ පරිසරය සංරක්ෂණය පදනම් කරගෙන කලපු ආශ්‍රිත ගම්වල නැවත පදිංචි කිරීම සඳහා රු.මිලියන 110 ක් වෙන් කර තිබුණ ද, කලපු පිරිසිදු කිරීමේ ප්‍රධාන කාර්යය හා අනුමත සෙසු කාර්යයන් ද ඉටුකර නොතිබුණි. එසේ තිබිය දී අනුමැතියක් ලබාදී නොතිබූ කලපු ආශ්‍රිත නොවන යටිතල පහසුකම් වූ අව් ආවරණ ඉදිකිරීම්, මාර්ග වැඩි දියුණු කිරීමේ යනාදි යටිතල පහසුකම් සඳහා රු.මිලියන 119 ක් වැයකර තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබානොදුන් ක්‍රියාකාරකම්වලට මුදල් නොයෙදවීම කළ යුතු වීම. | කලපු ආශ්‍රිතව අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය මෙම ව්‍යාපතියේ අරමුණකි. ජීවනෝපාය වැඩසටහන් මෙන්ම ක්‍රියාකාරි සැලැස්මේ දක්වා ඇති සෙසු සංවර්ධන ව්‍යාපෘති මගින් ද කලපු සංවර්ධනය හා නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන සඳහා සෘජු හෝ වක්‍ර ප්‍රතිඵල ලැබේ. |
| iii. | කලපු සීමා ලකුණු කිරීම සඳහා මිලදී ගත් රු. මිලියන 7.7 ක් වටිනා මායිම් ගල් 4831 ක් මාස 6 කට අධික කාලයක සිට කලපු ආශ්‍රිතව ගොඩගසා තිබුණු අතර මායිම් ගල් අතරින් අදාල ප්‍රමිතියට නොවූ මායිම් ගල් පැවති බව ද භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | අපේක්ෂිත නිමැවුම ලබාගැනීමේ අවශ්‍යතාව පදනම් කරගෙන මිලදී ගැනීම් කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම කළයුතු වුවත්, 2016, 2017 හා 2019 වර්ෂවල නිකුත් කළ රු.මිලියන 13.51 ක් | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී නිශ්චිත කාල සීමාවන් තුළ පිළිතුරු ඉදිරිපත් කළ යුතු බව අදාල නිලධාරීන්ට දන්වා ඇත. |

වටිනා විගණන විමසුම් පිළිවෙලින් 1 ක් 2 ක් සහ 3 ක් සම්බන්ධයෙන් නිශ්චිත කාල සීමාවන් තුළ පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට අමාත්‍යාංශ භූමියේ පවත්වාගෙන යන සහන වෙළඳසැල වෙනුවෙන් අමාත්‍යාංශයට බදු කුලියක් අයකරගෙන නොතිබුණු අතර විගණිත දිනය වූ 2019 ජනවාරි 07 දින දක්වා භාවිතා කරන ලද විදුලි ඒකක 28730 ක් සඳහා අමාත්‍යාංශය ආසන්න වශයෙන් ගෙවන ලද රු.626,314 ක් ද අය කරගෙන නොතිබුණි. | රජයේ මුදල් සහ දේපළ අවභාවිතය සඳහා යොදානොගත යුතු වීම. | අදාල කාලයට අයවිය යුතු සියලුම විදුලිය සඳහා වූ වියදම අදාල පුද්ගලයාගෙන් අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා ඇත. |
| (ආ) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කම්කරු සබඳතා අංශයක් නොතිබිය දී එම අංශයට අංක KD 7689 දරන කැබ් රථය වෙන්කර තිබුණි. නිල වාහනයක හිමිකම් නොමැති සහකාර ලේකම්වරයකු විසින් එම වාහනය භාවිතා කර තිබුණු අතර, නිලධාරියා කෘෂිකර්ම අමාත්‍යාංශයට වාහනය රැගෙන ගොස් තිබුණි. 2019 අගෝස්තු මස වනවිටත් අදාල වාහනය අමාත්‍යාංශය වෙත භාරදී නොතිබුණි. | වාහන අවභාවිතයක් නොවන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

**3.5** විදේශ ආධාර ව්‍යාපෘති

------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රයට දීර්ඝකාලීන ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2017 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රජය හා නෝර්විජියානු විදේශ කටයුතු අමාත්‍යාංශය අතර රු.149,400,000 (ක්‍රෝන් 8,300,000) ක ප්‍රදානයකට ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර විගණනයට ලැබුණු තොරතුරු අනුව 2017 හා 2018 වර්ෂවල රු.111,572,707 ක් වැයකර තිබුණ ද ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශනවලින් එය හෙළිදරව් කර නොතිබුණි. තවද ගිවිසුමේ 10.1 හා 10.3 කොන්දේසිවලට අනුව උක්ත ව්‍යාපෘතියට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ විගණකාධිපති විසින් විගණනය කළ යුතු බව දක්වා තිබුණ ද එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2019 ජූලි 31 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියට අදාල සියලු වියදම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුවීම හා ගිවිසුම ප්‍රකාරව විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී අදාල වර්ෂ වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමටත් කඩිනමින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. |

**3.6** **ප්‍රසම්පාදනයන්**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | හලාවත ධීවර වරායේ මසුන් වෙන්දේසි කිරීමේ ශාලාව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව | | |
| i. | 2007 ඔක්තෝබර් 03 දිනැති අංක 13 දරන අතිරේකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි නොවූ ඉදිකිරීම් සමාගමක් වෙත රු.මිලියන 51.08 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද්දේ 2016 දෙසැම්බර් 16 දිනය. එදින දක්වා බල පැවැත් වූ 1987 පොදු කොන්ත්‍රාත් පනත අංක 3 අනුව ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වීම අවශ්‍ය නැත. කෙසේ වෙතත් 2018 |

| | | | |
|---|---|---|---|
| | ක් වටිනා මසුන් වෙන්දේසි කිරීමේ ශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | | ඔක්තෝබර් 16 දිනැති සංශෝධනයට අනුව මේ වන විට සියලු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය අවශ්‍ය වුවත් එම විධිවිධාන මෙම කොන්ත්‍රාත්තුව සඳහා අදාල නැත. ඒ අනුව ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ ලියාපදංචිය ලබාගෙන නැත. |
| ii. | මෙම කොන්ත්‍රාත්තුව දින 180 කින් නිමකිරීමට පිරිනමා තිබුණු අතර 2019 ජුනි මස වන විට රු.මිලියන 48 ක් ගෙවා තිබුණ ද එදිනට දින 279 ක කාලයක් ඉක්මවා ඇතත් වැඩ අවසන් කර භාර දී නොතිබුණි. | කොන්ත්‍රාත්තු ගිවිසුම අනුව නියමිත කාලවකවානු තුල අදාල කොන්ත්‍රාතුවේ වැඩ අවසන් කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නැත. |
| iii. | ඇලුමිනියම් දොර ජනෙල් සහ ටයිල් ඇතිරීම යන වැඩ විෂයන්, ලංසු ලේඛනවල දක්වා තිබූ පිරිවිතරවලට අනුකූල නොවන පරිදි ඉටුකර තිබුණු අතර ඇලුමිනියම් දොර ජනෙල් පිරිවිතරය මයික්‍රෝන් 60 ත් 80 අතර තිබෙන බවට බිල්පතේ හෝ පරීක්ෂණ වාර්තාවලින් තහවුරු කිරීමකින් තොරව රු.මිලියන 3.25 ක් ගෙවීම් කර තිබුණි. එසේම පිරිවිතර අනුව **ලංකාවේ නිෂ්පාදිත** ටයිල් වෙනුවට ඉන්දියාවේ නිෂ්පාදිත ටයිල් අතුරා, ප්‍රමාණ පත්‍රයේ සඳහන් මිලට වැඩි මිලක් මත රු.මිලියන 3.89 ක් ගෙවා තිබුණි. | ලංසු ලේඛනවල දක්වා තිබූ පිරිවිතරවලට අනුකූල බව පරීක්ෂා කර අදාල ගෙවීම් කළ යුතුවීම. | පවුඩර් කෝටඩ් (Powder Coated) වර්ගයේ ඇලුමිනියම් බාර්වල පවුඩර් කෝටඩ්වල ඝණකම මයික්‍රොන 60 ත් 80 ත් අතර (Coating Thickness 60 -80 Microns) විය යුතුය. මෙය (Powder Coated) සාමාන්‍ය පිරිවිතරයයි. එම නිසා මේ සම්බන්ධව විශේෂ ප්‍රමිති සහතිකයක් අවශ්‍ය නොවේ. මෙන්ම ප්‍රමාණ පත්‍රයේ සඳහන් ටයිල් නොයොදා ගුණාත්මකභාවයෙන් යුතු වෙනත් විචල්‍ය ටයිල් වර්ගයක් යොදන ලදී. ඒ සඳහා අනුමත කරන ලද නව මිලක් ගෙවන ලද අතර ප්‍රමාණ පත්‍රයේ සඳහන් මිලගණන් භාවිතා නොකරන ලදී. |
| (ආ) | වෙන්නප්පුව වෙල්ලමංකර ධීවර වරාය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව | | |
| i. | වරාය ඉදිකිරීමට වටිනාකම රු.මිලියන 1,862 කට අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ දී 2006 අංක 6 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.5. මාර්ගෝපදේශය ප්‍රකාරව $CS_1$ | මාර්ගෝපදේශයට අනුව නිශ්චිත ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවකු වෙත ලංසු ප්‍රධානය කළ යුතු වීම. | එකඟ වෙමි. ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 2506 ක් හා අදාල ඉදිකිරීම් සමාගම $CS_1$ කාණ්ඩයේ සමාගමක් විය යුතු බවට කර ඇති නිරීක්ෂණය වැරදි ගණනය |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රේණියේ ක්‍රොන්ත්‍රාත්කරුවකු වෙත පැවරිය යුතු කොන්ත්‍රාත්තුව $C_1$ ශ්‍රේණියේ ක්‍රොන්ත්‍රාත්කරුවකු වෙත සීමාව ඉක්මවා රු.මිලියන 770.39 ක් වැඩිපුර ප්‍රදානය කර තිබුණි. | | කිරීමක් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වරදවා වටහා ගැනීමක් බව පෙනේ. |
| ii. | 2007 ඔක්තෝබර් 03 දිනැති අංක 13 දරන අතිරේකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවකු ලංසු ඉදිරිපත් කර තිබිය දී, ලියාපදිංචි නොවූ ඉදිකිරීම් සමාගමක් වෙත රු.මිලියන 1,862 ක ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව දින 912 කින් නිමකිරීමට පිරිනමා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 1987 පොදු කොන්ත්‍රාත් පනත අංක 3 අනුව ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වීම අවශ්‍ය නැත. කෙසේ වෙතත් 2018 ඔක්තෝබර් 16 දිනැති සංශෝධනයට අනුව මේ වන විට සියලු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය අවශ්‍ය වුවත් එම විධිවිධාන මෙම කොන්ත්‍රාත්තුව සඳහා අදාල නැත. ඒ අනුව ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ ලියාපදංචිය ලබාගෙන නැත. |
| iii. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 (ක) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර ප්‍රදානය කර තිබූ ක්‍රොන්ත්‍රාත් වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 5 ක සිට සියයට 28 ක දක්වා පරාසයක මිලගණන්වල අඩුවක් නිරීක්ෂණය වී තිබුණි. එහෙත් ප්‍රසම්පාදන අස්ථිත්වය ඇගයීම් කිරීමේ දී ඒ පිළිබඳව සලකා බලා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ලංසු මිලගණන් ආන්තික වශයෙන් අඩුනම් ප්‍රසම්පාදන අස්ථිත්වය ඒ පිළිබඳව දැඩි අවධානයකින් සලකා බැලිය යුතු වීම. | ඔබ විමසුමේ සියයට 28 අඩුවීමක් ලෙස දක්වා ඇති අයිතමයේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 3.36 කි. කොන්ත්‍රාත්කරු විසින් එය රු.මිලියන 2.428 කට ලංසු ඉදිරිපත් කර ඇත.<br>මෙය තීරණාත්මකව සලකා බැලිය යුතු කාර්යයක් ලෙස තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් හඳුනාගෙන නැත. |

| | | | |
|---|---|---|---|
| iv. | වරායේ දියකඩන දෙකක් ඉදිකිරීමට අදාලව ගෙවීම් කර තිබූ බිල්පත් සැසඳීමේ දී උතුරු දියකඩනයේ පළමු මීටර් 125 ක් ඉදිකිරීමේ දී භාවිතා කළ ද්‍රව්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර ද්‍රව්‍ය ප්‍රධාන දියකඩනය පළමු මීටර් 125 ඉදිකිරීමේ දී යොදා ගැනීම නිසා ද්‍රව්‍ය ඝණ මීටර් 11526.3 සඳහා රු.මිලියන 55.77 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | විශේෂ හේතු නොමැති අවස්ථාවක කොන්ත්‍රාත් ඉදිකිරීම් පිරිවැය සමාන මට්ටමකින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | දියකඩනය ඉදිකිරීම් සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය ප්‍රමාණය එකී දියකඩනය ඉදිකරන ස්ථානයේ මුහුදේ ගැඹුර හා දියකඩනයේ පළල අනුව තීරණය වේ. උතුරු දිකඩනය මීටර් 125 ක් වන ස්ථානයේ පළල මීටර් 45 ක් වුවත් ප්‍රදාන දියකඩනයේ මීටර් 300 ක් වන ස්ථානයේ පළල මීටර් 53 කි. කෙසේ වෙතත් ගෙවීම් සිදු කිරීමේ දී Measure and Pay ක්‍රමවේදය අනුගමනය කරන බැවින් සත්‍ය ප්‍රමාණයන්ට පමණක් ගෙවීම් සිදු කෙරේ. |
| (ඇ) | කරෛයිනගර් බෝට්ටු අංගනයේ පහසුකම් වැඩි දියුණු කිරීම | | |
| i. | බෝට්ටු අංගනයේ ඉන්ටර් ලොග් ගල් ඇතිරීම වෙනුවෙන් වූ පිරිවිතරය මිලිමීටරයට නිව්ටන් 20 ක (20 $N/mm^2$) ශක්තියෙන් යුතු ගල් වෙනුවට ප්‍රමිතියෙන් අඩු මිලිමීටර් නිව්ටන් 9.73 සිට 18 දක්වා පරාසයක ගල් වෙනුවෙන් රු.මිලියන 14.76 ක් ගෙවා තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ සඳහන් පිරිවිතරයට අනුව සපයා ඇතිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත |
| ii. | බෝට්ටු අංගනයේ ඉන්ටර් ලොග් ගල් ඇතිරීමට පෙර භූමිය සකස් කරගැනීම සඳහා ප්‍රමාණ පත්‍රයේ සඳහන් නොවූ ABC මිශ්‍රණය වෙනුවෙන් අනුමැතියකින් තොරව ඝණ මීටර් 1,054.61 ක් සඳහා රු.මිලියන 8.89 ක් ද සපයා නොතිබුණු ABC ඝණ මීටර් 113.99 ක් සඳහා රු.961,103 ක් ද ගෙවා තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ සඳහන් පිරිවිතරයට අනුව සපයා ඇතිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත |
| iii. | බෝට්ටු අංගනයේ පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 238.8 ක් වැයකර පැකේජ 3 ක් යටතේ ඉදිකිරීම 2019 මාර්තු 22 දින නිමකර අමාත්‍යාංශය වෙත භාරදී තිබුණ ද 2019 ජුනි 30 දින වනවිටත් බෝට්ටු අංගනය භාවිතයට ගෙන නොතිබුණි. | වැඩ නිමකිරීම් සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත |

**3.7 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයකු වෙත පවරා තිබූ මෝටර් රථය වලංගු රියැදුරු බලපත්‍රයක් රහිතව බීමතින් ධාවනය කර 2018 ජුනි 05 දින අනතුරට පත්කර අමාත්‍යාංශයට රු.997,824 ක අලාභයක් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් අත්හිටවූ සිර දඬුවම් නියම කර රු.10,500 ක දඩ නියම කර තිබුණු අතර නිලධාරියා විසින් රු.423,000 ක් වැයකර වාහනය අලුත්වැඩියා කර අමාත්‍යාංශයට භාර දී තිබුණි. එහෙත් මුදල් රෙගුලාසි 140(2) හා මුදල් රෙගුලාසි 1642 ප්‍රකාර පිළිවෙලින් මෙම පාඩුව සම්බන්ධයෙන් වාර්තාවේ පිටපතක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යැවීමක් හා අනතුර සිදුවූ වහාම ඒ පිළිබඳව පොලිසියට වාර්තා කිරීමක් සිදුකර නොතිබුණි. | රාජකාරියේ දී සිදුකරන විෂමචාරයන් පිළිබඳව ආයතන සංග්‍රහයට අනුව අදාල නිලධාරීන්ට තනතුර කුමක් ද නොබලා විනය නියෝග ක්‍රියාත්මක කළ යුතු වීම.<br><br>වාහනයට සිදුවන අනතුරු පිළිබඳව ආයතන ප්‍රධානියා දැනුවත් කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වර්ෂය වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණි. ඊට ගැලපෙන පරිදි අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක ද නිවැරදි දත්ත ලබා ගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ද හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |